# උපන්දින තෑග්ග



ටී. ඒ. බිනුලි හිරුන්යා මුණසිංහ

| | |
|---|---|
| කෘතියේ නම | උපන්දින තෑග්ග |
| කතෘගේ නම | ටී. ඒ. බිනුලි හිරුන්යා මුණසිංහ |
| කතෘ අයිතිය ඇතුළු විස්තර | ISBN 978 – 624 -206 – 723 - 0 |
| කතෘගේ වෙනත් කෘති | දඟකාර අලි පැංචා |
| කෘතිය පල කරන දින | 2023 – 11 -15 |

# පිදුම

කුඩා කල සිට

අකුරු කියා දුන්

සියලුම ගුරු මෑණිවරුන්ට හා ගුරුපියවරුන්ටත්

මගේ පන්ති භාර ගුරු මෑණිය වන සමන්මලී ගුරු මෑණියන්ටත්

මගේ දෙමව්පියන්ටත්

මෙම පොත ගෞරවයෙන් පුදමි.

## පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මග පෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුම කරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරි කොට ගෙන ග්‍රන්ථ කරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ  ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාට් දරුවනට ගැලපෙන ලෙස නවීකරණය කරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත් කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතු වන වටිනාකම සලකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට එකතු වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුලින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර 2023. 11. 01

එමලි කියලා හොඳ ළමයෙක් හිටියා. දවසක් එමලිගේ අම්මා එමලීව කඩයකට එක්කන් ගියා.එමලි ලස්සන පොතක් දැක්කා.අනේ අම්මේ, පුළුවන් නම් මට අර පොත අරන් දෙනවද? එමලී ඇහුවා. මුදලාලි, අර පොත කීයද? අම්මා ඇහුවා. රුපියල් 500යි, මුදලාලි කිව්වා. අනේ පුතේ, මගේ ළඟ දැන් රුපියල් පන්සියයක් නැහැනේ. මම ඔයාගේ උපන්දිනයට මේ පොත අරන් දෙන්නම්, අම්මා කිව්වා. හොඳයි අම්මේ, එමලි කිව්වා.



එමලීගේ උපන්දිනයට තව දින පහක් තිබුණා. පසුවදා එමලි පාසලට ගියා. එමලි යාලුවන්ටත් එයා දැකපු පොත ගැන කිව්වා. මේ විදිහට දින හතරක් ම ගත වුණා. එමලී පාඩම් වැඩ ඉවර කරලා රෑ නින්දට ගියා.



උපන්දිනය දා ඇය උදේ අවදි වන විට ඇගේ කොට්ටය උඩ අර පොත තියෙනවා එමලී දැක්කා. එමලිට හරිම සතුටුයි. එමලී පොත දිග ඇරියා. එකපාරටම පොත ඇතුළෙන් දම්පාට දුමක් පිට වුණා. එම දුම අතරින් අඟුටුමිට්ටෙක් එළියට ආවා. එමලි හොඳටම බය වුණා. එමලි පොත පැත්තකට විසි කළා. අඟුටුමිට්ටා ඇඳ යටට විසිවුණා. එමලී බයෙන් බයෙන් ඇඳ යටට එබිලා බැලුවා.



කොහොමද එමලී? සුබ උපන්දිනයක් වේවා! අඟුටුමිට්ටා කිව්වා. ඔයා කැමතිද මගේ ලෝකෙ බලන්න? අඟටුමිට්ටා ඇහුවා. එමලිට හරි පුදුමයි. මට ආයෙ එන්න පුලුවන් වෙයිද ? එමලී ඇහුවා. ඔව්, අපිට ආයේ එන්න පුළුවන් , අඟුටුමිට්ටා කිව්වා. එමලී ගමන යන්න කැමැති වුණා. අඟුටුමිට්ටා එමලීව කුඩා ළමයෙක් බවට පත් කළා. කෝ පොත?. එන්න අපි යමු පොත ළඟට, අඟටුමිට්ටා කිව්වා.



දෙන්නාම විසිවුණු පොත ළඟට ගියා. අඟුටුමිට්ටා පොතේ කළු පාට රවුමක් ඇන්දා. එමලිගේ අත අල්ලාගෙන කළු පාට රවුම මැදට පැන්නා. දෙන්නාම කළු කුහරයක් දිගේ ලිස්සා ගෙන පහළට වැටුණා. එමලි ඇස් දෙක වහගත්තා. ඇස් ඇරලා බලනකොට එයාලා හිටියේ ලස්සන ගඟක් ළඟ.

අපි මේ ගඟ දිගේ පහළට යමු ද? අඟුටුමිට්ටා ඇහුවා. එමලී ඒකට කැමති වුණා . ලූෆී , ලූෆී අඟුටුමිට්ටා කෑ ගැහුවා. ලස්සන හංසයෙක් ගඟ මැද්දෙන් මතුවුණා. දෙන්නම හංසයාගේ පිටට නැග්ගා. හංසයා මේ දෙන්නාව ගඟ දිගේ පහළට එක්කගෙන ගියා. ගඟ දෙපැත්තේ තියෙන ලස්සන දේවල් දිහා එමලි පුදුම වෙලා බලන් හිටියා.



එකපාරට ම අපිව මෙතනින් බස්සන්න කියලා අඟුටුමිට්ටා හංසයාට කිව්වා. එතැන තිබුණේ ලස්සන මල් වත්තක්. හංසයාගේ පිටින් බැස මේ දෙන්නා මල්වත්ත දෙසට ගියා.



මල් වත්ත දිගේ යනකොට අඟුටුමිටි ගම්මානය හම්බ වුණා. අඟුටුමිටි ගම්මානය හරිම ලස්සනයි. එමලිට හරිම පුදුමයි. පොඩි පොඩි අඟුටුමිට්ටන් ගොඩක් එමලීව පිළිගන්නට පැමිණියා. එමලි ට රසම රස කෑම ගොඩක් එයාලා ගෙනත් දුන්නා. ඔයාලා දන්නව ද? අද එමලිගේ උපන්දිනය, පුංචි අඟුටුමිට්ටා එයාගේ යාලුවන්ට කිව්වා. හැමෝම එකතු වෙලා රසම රස කේක් එකක් හැදුවා. කේක් එක කපලා උපන් දිනය සැමරුවා. එමලීට හරිම සතුටුයි. පොඩි ළමයි එක්ක එමලී සෙල්ලම් කළා . වෙලාව ගත වෙනවා එමලී ට දැනුනෙත් නෑ.



සෙල්ලම් කරලා ම එමලීට දැන් හරිම මහන්සියි. පොඩි නිදිමතකුත් දැනුනා. එයාට අම්මා මතක් වුනා. අම්මා දැන් බය වෙලා ඇති කියලා

එයාට හිතුණා . දැන් මාව ගෙදර එක්කගෙන යනවා ද? එමලී අඟුටුමිට්ටාගෙන් ඇහුවා. හරි දැන් අපි ඔයාගේ ගෙදර යමු, අගුටුමිට්ටා කිව්වා. අඟුටුමිටි යාළුවන්ට ආචාර කරලා ඒ දෙන්නම නැවත ගමනට පිටත් වුණා. මල් වත්ත දිගේ ගඟ ළඟට ආවා. ලූහින් හංසයා මේ දෙන්නා එනකං ගඟ ළඟ ඉන්නවා එමලි දැක්කා. එමලිට හරිම සතුටුයි. හංසයාගේ පිටේ නැගලා මේ දෙන්නම ගමන පටන් ගත්ත තැනට ආවා. ස්තුතියි ලූහී , මේ දෙන්නම හංසයාට ආචාර කළා.

දැන් අපි කොහොමද මෙතනින් එහාට යන්නේ, එමලී ඇහුවා. මගේ අත අල්ල ගන්න, අගුටුමිට්ටා කිව්වා. එමලී අඟුටුමිට්ටාගේ අත අල්ලා ගත්තා. අඟුටුමිට්ටා කළුපාට රවුමක් ඇඳලා දැන් අපි මේකට පනිමු කියලා කිව්වා. දෙන්නම කළුපාට රවුම මැද්දට පැන්නා. එමලියි අඟුටුමිට්ටයි  ඇඳ යටින් මතුවුණා.



අඟුටු මිට්ටා එමලීව හිටපු තත්ත්වයට ම පත් කරා. එමලිට එයා ගිය චාරිකාව ගැන හරිම සතුටුයි. උපන්දිනේ දවසේ එයාව සතුටු කළ එකට එයා අඟුටුමිට්ටාට ස්තුති කළා.

එමලී, එමලී, අම්මා කතා කරනවා එමලිට ඇහුණා .අන්න අම්මා කාමරයට එනවා, එමලී අඟුටු මිට්ටාට කිව්වා. එහෙනම් දැන් මට යන්න වෙලාව හරි, අඟුටුමිට්ටා කිව්වා. අම්මට මම මොනවද කියන්නේ, එමලී අඟුටුමිට්ටා ගෙන් ඇහුවා. ඔයා මොනවත් කියන්න ඕනෙ වෙන්නෙ නෑ. අපේ ලෝකේ දවසක් කියන්නේ ඔයාලගේ ලෝකේ විනාඩි පහක්, අඟුටුමිට්ටා කිව්වා.

ඔයා හොඳ කී කරු ළමයෙක් නිසා මම ඔයාට දුන්නු උපන්දින තෑග්ග තමයි මේ චාරිකාව, අගුටුමිට්ටා කිව්වා. එහෙනම් මම දැන් යනවා හැමදාමත් හොඳ කීකරු ළමයෙක් වගේ හැදෙන්න ඕනේ, අඟුටුමිට්ටා එමලීට කිව්වා. බොහොම ස්තූතියි යාළුවේ , එමලි කිව්වා. අපි ආයේ දවසක හම්බවෙමු, අඟුටුමිට්ටා කිව්වා.එකපාරටම දම්පාට දුමක් මතුවුණා, දුම අතරින් අඟුටුමිට්ටා පොත ඇතුළට රිංගා ගත්තා. සුබ ගමන් යාළුවේ, එමලි කිව්වා.





මගේ දුව ඇහැරුණා ද? ඔයාට සුබ  උපන්දිනයක් වේවා! එදා මගේ දුව මගෙන් උපන්දිනය දවසට ඉල්ලුව පොත මම උදේම ඔයාගේ කොට්ටය උඩින් තිබ්බා .අම්මා කාමරය ඇතුළට ඇවිත් එමලීට කිව්වා. බොහොම ස්තූතියි අම්මේ , එමලී අම්මාව බදා ගත්තා. අම්මා ආදරයෙන් එමලිගේ ඔළුව අතගෑවා.



# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතු වීමත් සමඟ සිදු වන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොතපතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප් නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියා මූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහමායා පුංචි ගත් කතුවරයන් ය. පාසල තුල ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබා දෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල් වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මග පෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම් කරුවන්ට මෙම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි.පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවියේ දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත් කතු අංකුර ඔබට ලෝකයේ දිනන ගත් කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට

සෙනවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කළ ව්‍යාපෘතියේ නිර්මාපක 2023. 11. 01